# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report 2008





GRACEFULLY FORWARD

**සීමාසහිත ලංකා සතොස**
සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

**லங்கா சதொச லிமிடட்**
நவீன வர்த்தகத்தின் தனிச் சிறப்பு

**Lanka Sathosa Limited**
A unique take on modern trade

# වාර්ෂික වාර්තාව

2008

## ලංකා සතොස

සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

## පටුන


| | |
|---|---|
| සංස්ථාපිත තොරතුරු | 2 |
| දැක්ම හා මෙහෙවර | 3 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 4 |
| අධ්‍යක්ෂතුමාගේ වාර්තාව | 5 |
| මූල්‍ය සමාලෝචනය | 6 |
| සංස්ථාපිත පාලනය | 7 |
| අගය එකතු කළ ප්‍රකාශනය | 8 |
| ස්වාධීන විගණක වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන | 9 |


ලංකා සතොස

අභිමානයෙන් ඉදිරියට

# ලංකා සතොස
## සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

### සංස්ථාපිත තොරතුරු

| | |
|---|---|
| ආයතනය | - සීමාසහිත ලංකා සතොස |
| ලියාපදිංචි ලිපිනය | - අංක 108, නිග්‍රිස් ගොඩනැගිල්ල, යෝක් වීදිය, කොළඹ 01 |
| නෛතික තත්ත්වය | - 2007 අංක 07 දරණ සමාගම් ආඥාපණත යටතේ<br>ශ්‍රී ලංකාවේ සංස්ථාපිත පූර්ණ රාජ්‍ය සමාගමකි. |
| සමාගමේ ලියාපදිංචි අංකය | - පී බී 1326 (පැරණි අංකය එන් (පී බී එස්) 1290) |
| ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය | - අංක 108, නිග්‍රිස් ගොඩනැගිල්ල, යෝක් වීදිය කොළඹ 01<br>දුරකථන - 94-11-2436301-2<br>ෆැක්ස් - 94-11-2437583 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | - සභාපති / අධ්‍යක්ෂ - කේ. නලින් ආර් ප්‍රනාන්දු මහතා<br>- අමාත්‍යංශ ලේකම් - වෛද්‍ය ආර් එම් කේ රත්නායක<br>- අමාත්‍යංශ සහකාර ලේකම් - ඩී එස් ආර් ඩී සී ටී රත්නායක මිය<br>- පිස්කල් ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්<br>සජිත් රුචික ආටිගල මහතා<br>- අතිරේක ලේකම් සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යංශය<br>- ඩී ජීවානන්දන් මහතා<br>- අධ්‍යක්ෂ ජනරාල් රාජ්‍ය ගිණුම් මහා භාණ්ඩාගාරය - ඩී විදානගමාච්චි මහතා<br>- සමුපකාර සංවර්ධන කොමසාරිස් ඒ පී ජී කිත්සිරි මහතා<br>- කළමනාකාර අධ්‍යක්ෂ ඔරික්ස් බෙනෝඩාර් සමාගම එරල් වීරසිංහ මහතා |
| අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | - එස් විජේවර්ධන |
| විගණකවරු | - එම්/එස් එච්. එල්. බී එදිරිසිංහ සහ සමාගම, වරලත් ගණකාධිකාරීවරු,<br>45 බේබෑක් පෙදෙස කොළඹ 02. |
| සමාගමේ බැංකුකරුවෝ | - මහජන බැංකුව සංස්ථාපිත ශාඛාව ලේක් හවුස් ගොඩනැගිල්ල<br>ඩී ආර් විජේවර්ධන මාවත කොළඹ 10 |
| කොටස්කරුවෝ | - මහා භාණ්ඩාගාරය - කොටස් සියයට 45 යි,<br>සමුපකාර තොග වෙළඳ සංස්ථාව සියයට 55 යි |

ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

# ලංකා සතොස

## සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු



## දැක්ම

පුළුල් ලෙස පැතිර ගිය සිල්ලර වෙළඳ ජාලයක් බවට පත්වීම හා පාරිභෝගිකයන් වෙනුවෙන් කැපවූ අගයෙන් අනූන විශිෂ්ඨ සේවා සපයන්නෙකු බවට පත්වීම අපේ දැක්මයි.



## මෙහෙවර

දේශීය හා ජාත්‍යන්තර වශයෙන් භාණ්ඩ මිළදී ගනිමින් රටපුරා ඇති අපගේ අලෙවිසැල් ජාලය මගින් සාධාරණ මිළට පාරිභෝගික භාණ්ඩ ලබා දෙමින් කාර්යක්‍ෂම හා උසස් තත්ත්වයෙන් පාරිභෝගික සේවාවක් සැලසීම අපේ මෙහෙවරයි.



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

2008

# වාර්ෂික වාර්තාව

## ලංකා සතොස
සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

### සභාපතිතුමාගේ පණිවුඩය



සීමාසහිත ලංකා සතොස 2008 දෙසැම්බර් 31 න් අවසන් වූ වසරේ වාර්ෂික වාර්තාව හා අවසාන ගිණුම මම ඉතා සතුටින් ඉදිරිපත් කරමි.

මෙතෙක් අප ආ ගමන පිළිබඳව ආපසු හැරී බැලීමේදී 2005 වසරේ ආරම්භක අවස්ථාවේ සිට මෙතෙක් සීමාසහිත ලංකා සතොස ආයතනය ලබා ඇති දියුණුව පිළිබඳව මා තෘප්තිමත් හා ආඩම්බර වන අතර එහිදී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා හා අභාවප්‍රාප්ත ගරු අමාත්‍ය ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතුතුමා මෙම ආයතනය පිහිටුවීමේදී මූලික කරගත් උතුම් අරමුණු ඉටුකර ගැනීමට හැකිවීම ගැන වඩාත් සතුටට පත්වෙමු. ඉන් පසුව පත්වූ වෙළඳ ඇමතිතුමාද ලංකා සතොස ආයතනය වත්මන් දියුණු තත්ත්වයට ගෙනඒම සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරමින් සිටී.

සීමාසහිත ලංකා සතොස මේ වනවිට ශාඛා සියයකින් සමන්විත වන අතර සෑම ශාඛාවකම එකම මිල ගණන් පවත්වාගෙන යන ශ්‍රී ලංකාවේ විශාලතම සිල්ලර වෙළඳසැල් ජාලය බවට පත්වී ඇතැයි කිව හැකිය. මෙම ශාඛා ජාලය ලබන වසර වනවිට ශාඛා 150 ක් දක්වා වැඩි කිරීමට අපට උපදෙස් ලැබී තිබේ. අතිගරු ජනාධිපතිතුමා හා ගරු වෙළඳ ඇමතිතුමාගේ මඟපෙන්වීම හා සහයෝගය මත එම ඉලක්කය සපුරා ගැනීමට හැකි බව අපගේ විශ්වාසයයි.

ග්‍රාමීය තරුණ තරුණියන්ට රැකියා අවස්ථා සැපයීම හා ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම පාලනයේ නිරත ඕනෑම රජයකට ඇති අසීරු අභියෝගයකි. එහිදී සීමාසහිත ලංකා සතොස ආයතනය රැකියා අවස්ථා 884 ක් උදාකර දෙමින් මහඟු සේවාවක් ඉටුකර දී තිබීම එය වත්මන් රජයට ඇති විරැකියා ප්‍රශ්නය යම් දුරකට විසඳාලීමකි. ඊට අමතරව වෙළඳපොලේ භාණ්ඩ වල සිල්ලර මිල පාලනය සඳහා ලංකා සතොස ආයතනය,තම නිශ්පාදන වලට නිසි මිලක් නොමැතිව පීඩා විඳින දුෂ්කර ප්‍රදේශ වල  ගොවියන් කරා ලඟා වෙමින් ඔවුන්ගේ නිශ්පාදන සාධාරණ හා ඉහල මිලකට මිලදී ගැනීම ආරම්භ කර ඇත.  එමගින් ඔවුන් වෙළඳාමේ නිරත අතරමැදියන් විසින් සූරාකනු ලැබීම වලක්වා තිබේ.

වෙළඳපොල ප්‍රවණතා හා නූතන වෙළඳාමේ ඇති අවදානම් පිළිබඳවද අපි දැඩි අවධානය යොමුකර ඇති අතර කළමනාකරණ තොරතුරු පද්ධතිය  ඉතා උසස් මට්ටමින් පවත්වාගෙන යාමට උත්සාහ දරමින් එම අවදානම් නිවැරදි ලෙස තක්සේරු කරමින් අපගේ වටිනා පාරිභෝගිකයින්ට වඩා හොඳ සේවාවක් සපයමින් ආයතනයේ ලාභය වැඩිකර ගැනීමට අවශ්‍ය ව්‍යාපාරික තීරණ ගැනීමටද හැකිවී තිබේ. ආයතනයේ සාර්ථකත්වය උදෙසා මහඟු දායකත්වයක් සැපයූ අධ්‍යක්ෂ මණ්ඩලයටද කළමනාකරණ කණ්ඩායමටද, සියලුම මට්ටමේ කාර්ය මණ්ඩලයටද, අපගේ සැපයුම්කරුවන්ටද සීමාසහිත ලංකා සතොස ආයතනය මේ දක්වා මේ තත්ත්වයට ගෙනඒමට අපට අනුග්‍රහය දැක්වූ අපේ වටිනා පාරිභෝගිකයන්ටද මගේ හදපත්ලෙන් නැගෙන ප්‍රශංසාව පුදකිරීමටද මම මෙය අවස්ථාව කරගනිමි.



නලීන් ප්‍රනාන්දු
සභාපති

ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

# ලංකා සතොස
සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

## අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

අධ්‍යක්ෂවරු 2008 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන සමග ඔවුන්ගේ වාර්තාව මෙයින් ඉදිරිපත් කරති. සමාගමේ ක්‍රියාකාරකම් හා වසර තුල භාවිතා කල උපායමාර්ග හා සමාගමේ අනාගත සැලසුම් පිළිබඳව සභාපතිතුමාගේ ප්‍රකාශනයෙහි විස්තර කර ඇත.

**ලාභ සහ විසර්ජන**

| | 2008 | 2007 |
|---|---|---|
| බදු ගෙවීමෙන් පසු වසරේ ලාභය | 11,872,772 | (61,011) |
| ලාභය /පාඩුව ඉදිරියට ගෙන ආවා | (20,141,702) | (17,548,698) |
| පෙර වසරේ ගැලපුම් | (82,042) | (2,531,993) |
| රඳවාගත් ඉපයීම් / (පාඩුව) | (8,350,973) | (20,141,702) |

**ප්‍රාග්ධන වියදම**
ප්‍රධාන වශයෙන් ශාඛා ව්‍යාප්ත කිරීම හේතුවෙන් වසර තුළ සමාගම රුපියල් මිලියන 43.6 ක වියදමක් දරා ඇත.

**දේපල, යන්ත්‍රාගාර හා උපකරණ**
දේපල, යන්ත්‍රාගාර හා උපකරණ වල විචල්‍යයන් මුදල් ප්‍රකාශන වල අංක 9 සටහනේ සඳහන් කර ඇත.

**කොටස් හිමිකම්**
කොටස් වලින් සියයට 97 ක් මහා භාණ්ඩාගාරය සතුව පවතින අතර සියයට 3 ක් සමුපකාර තොග වෙළඳ සංස්ථාව සතුව පවතී.

**අධ්‍යක්ෂ මණ්ඩලය**
සංසථාපිත තොරතුරු වල සඳහන් කොට ඇති අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළුම දෙනා වසර පුරාම එහි සේවය කල අතර එරල් වීරසිංහ මහතා හැර අනෙක් සියලුම අධ්‍යක්ෂවරු සංස්ථාපිත පත්වීම් ලෙස අධක්‍ෂ මණ්ඩලයට පත්ව සිටී.

**කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ අයිතිවාසිකම්**
මූල්‍ය ප්‍රකාශන වල සටහන් 17 හි සඳහන් පරිදි සමාගමේ යෝජිත හෝ වත්මන් ව්‍යාපාර සම්බන්ධයෙන් එහි අධ්‍යක්ෂවරුන්ට කිසිදු ඍජු හෝ වක්‍ර අයිතිවාසිකමක් නැත.

**විගණනකරුවෝ**
එච්.එල්.බී. එදිරිසිංහ සහ සමාගමේ වරලත් ගණකාධිකාරීවරු සමාගමේ විගණනකරුවන් ලෙස යලි පත්කරනු ලැබීමට කැමැත්ත පලකර සිටිති. විගණනකරුවන්ගේ වැටුප් පිළිබඳව තීරණය කිරීමේ බලය අධ්‍යක්ෂවරුන් වෙත පවරා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

අත්සන් කලේ

එස් විජේවර්ධන
සමාගම් ලේකම්
2009.09.16

# ලංකා සතොස

## සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

### 2008 මූල්‍ය සමාලෝචනය

2008 වසර තුල නූතන වෙළඳ ක්ෂේත්‍රයේ වෙනත් තරගකරුවන් සියයට 20 ක වර්ධනයක් වාර්තා කරද්දී සීමාසහිත ලංකා සතොස සියයට 65 ක වර්ධනයක් අත්පත් කරගනිමින් රුපියල් බිලියන 3.6 ක පිරිවැටුමක් වාර්තා කලේය. ඊට ප්‍රධානම හේතුව වූයේ 2007 වසරේ 67 ක් වූ සිල්ලර වෙළඳ ශාඛා ජාලය 2008 වසරේදී ශාඛා සියයක් දක්වා වර්ධනය වීමයි. සෑම ශාඛාවකම පිරිවැටුම රුපියල් මිලියන 32 සිට මිලියන 36 දක්වා ප්‍රමාණයක් බැවින් ඉහළගොස් තිබේ.

පෙර වසර හා සැසඳීමේදී ගොන්ඩෝලා ආදී වෙනත් මාර්ග වලින් එන ආදායම් දෙගුණයකින් තරම් වැඩි වෙද්දී දළ ලාභ සීමාවන් වෙනස් නොවී පැවතුනි.

බෙදාහැරීමේ වියදම් සියයට 43කින් වැඩි වෙද්දී පරිපාලන වියදම් සියයට 60කින් වැඩිවී තිබේ. ඊට හේතුව නව ශාඛා විවෘත කිරීමේදී නව සේවකයින් බඳවා ගැනීමට සිදුවීමයි. සමාගමේ වැටුප් හා වේතන සියයට 41 ක පමණ වැඩිම වියදමක් දැරීමට සිදුවිය. එමෙන්ම වියදම් ණය හිමියන් සඳහා සියයට 36 ක මුදලක්ද රජයේ බදු සඳහා සියයට 16 මුදලක්ද වැයවිය.

2007 දී රුපියල් මිලියන 6 ක් වූ මෙහෙයුම් ලාභය 2008 වසරේදී රුපියල් මිලියන 18 ක් දක්වා තුන් ගුණයකින් වැඩි විය. බදු වලට පෙර ලාභය විශාල ප්‍රතිශතයකින් වැඩිකර ගැනීමට හැකිවූයේ වියදම් අඩුකොට ආර්ථිකය කළමනාකරණය කරගැනීම නිසාය.

ශාඛා ජාලය ව්‍යාප්ත කිරීම නිසා මුලු වත්කම් රුපියල් මිලියන 32 සිට මිලියන 66 ක් දක්වා ඉහළ ගියේය. එහිදී බොහොමයක් ශාඛා ගොඩනැගිලි කුලී පදනම මත ලබාගත් බැවින් කුලී අත්තිකාරම් මුදලද වැඩිවිය. බැංකු අයිරා ශේෂය රුපියල් මිලියන 150 ක් ලෙසද දැක්වුනද සීමාසහිත ලංකා සතොස සතුව බැංකු අයිරා පහසුකම් නොතිබුනි. ඒ අනුව සතොස චෙක්පත් නිකුත් කලද ඒවා බැංකු වෙත ඉදිරිපත් නොකෙරුණි. මහින්ද චින්තන ප්‍රතිපත්තියට අනුව දිවයිනේ විශාලතම වෙළඳ සංකීර්ණ ජාලය බවට පත්වීමේ අරමුණින් සතොස ශාඛා සංඛ්‍යාව තවත් වැඩි කිරීමේ සැළසුම් දැන් ක්‍රියාත්මකයි.

## සංස්ථාපිත පාලනය

කොටස්කරුවන්ගේ අයිතිවාසිකම් සුරැකීමට හා සිය සමාජ වගකීම ඉටුකිරීම සඳහා හොඳ යහපත් සංස්ථාපිත පාලනයක් හා හොඳම වෙළඳ ප්‍රතිපත්ති සමුදායක් භාවිත කිරීමේ අවශ්‍යතාව සමාගම හොඳින් හඳුනාගෙන තිබේ.

සීමාසහිත ලංකා සතොස කළමනාකරණය කරනු ලබන්නේ සභාපතිවරයා ප්‍රමුඛ අධ්‍යක්‍ෂ මණ්ඩලයකිනි. ඊට තොග හා සිල්ලර වෙළඳාම පිළිබඳව හසල අත්දැකීම් ඇති, භාණ්ඩාගාරය හා වෙළඳ අමාත්‍යංශයේ නියෝජිතයෝද ඇතුලත් වෙති. සමස්ථ වෙළඳ ප්‍රතිපත්ති හා උපායමාර්ග සකස් කිරීමේ වගකීම අධ්‍යක්‍ෂ මණ්ඩලයට පැවරී තිබේ. එහිදී ව්‍යාපාර කටයුතු සිදුකරගෙන යාම සඳහා කළමනාකාරීත්වයට නායකත්වය, උපදේශනය, මහපෙන්වීම, ප්‍රමුඛතා තීරණය කිරීම හා අදාල ප්‍රමිතීන් නිර්ණය කිරීමේ වගකීමද අධ්‍යක්‍ෂ මණ්ඩලය සතුව පවතී. අධ්‍යක්‍ෂ මණ්ඩලය අවම  වශයෙන් මසකට වරක් හෝ ඉඩ ප්‍රස්ථාව ඇති පරිදි නිතර නිතර රැස්වෙයි. සමාගමේ පාලනය විනිවිදභාවයේ හා එකබද්ධතාවයේ උසස්ම ප්‍රමිතීන් අනුව පවත්වාගෙන යාමට අධ්‍යක්‍ෂ මණ්ඩලය කැපවී සිටී. අධක්‍ෂ මණ්ඩලය විසින් සකස්කරුනු ලබන සමාගමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ඒවාගේ සාර්ථකත්වය අධීක්‍ෂණය කිරීමේ වගකීම සභාපතිවරයා සතුව පවතී.

සමාගමේ කළමනාකාරීත්වය සිය අධිකාරීත්වය පවත්වගෙන යන්නේ රජයට අයත් වාණිජ ව්‍යාපාර වලට අනුකූලව අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සකස් කරන ලද ප්‍රතිපත්ති රාමුව හා ආචාරධර්ම පද්ධතිය හා වෙළඳ භාවිතාවන් අනුගමනය කරමිනි. එමෙන්ම සමාගමේ සේවකයින්, පාරිභෝගිකයන්, සැපයුම්කරුවන් හා අවසන් වශයෙන් ප්‍රජාව සමග ගනුදෙනු කිරීමේදී මෙම භාවිතාවන් ඉතා හොඳින් අනුගමනය කිරිමටද කළමනාකාරීත්වය බැඳී සිටී. අභ්‍යන්තර පාලන ක්‍රමය පිළිබඳ මාර්ගෝපදේශ සකස් කොට ඇත්තේ සමාගමේ වත්කම් කිසිදු අවභාවිතයකට හෝ අනවසර පාවිච්චියකට යොදාගත නොහැකිවන පරිද්දෙනි. එම අරමුණෙන් අධ්‍යක්‍ෂ මණ්ඩලයට කලින් කලට ලැබෙන විශ්වසනීය තොරතුරු නිසි වාර්තා ලෙස පවත්වාගෙනයනු ලැබේ. වාණිජ යථාර්ථයේ සීමා තුල හිඳිමින් මූල්‍ය මෙන්ම මූල්‍ය නොවන තොරතුරු සම්පූර්ණයෙන් අනාවරණ කිරීමටද අධ්‍යක්‍ෂ මණ්ඩලය විශේෂ අවධානය යොමුකරයි.





අභිමානයෙන් ඉදිරියට

# ලංකා සතොස

## සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

| අගය එකතු කළ ප්‍රකාශනය | 2008 | | 2007 | |
|---|---|---|---|---|
| **අගය එකතු කළ නිර්මිතිය** | | | | |
| දළ ආදායම | 3,649,439,020 | | 2,212,832,759 | |
| විකුණුම් වියදම | (3,251,129,572) | | (1,949,316,730) | |
| මෙහෙයුම් වලින් අගය එකතු කිරීම | 398,309,448 | | 263,516,029 | |
| වෙනත් ආදායම් | 15,918,436 | | 5,775,365 | |
| එකතු කල මුලු අගය | 414,227,884 | | 269,291,394 | |
| **එකතු කල අගය බෙදාහැරීම** | | | | |
| වැටුප් සහ වේතන | 171,291,102 | 41.4 | 103,006,191 | 38.3 |
| ක්ෂයවීම | 10,425,995 | 2.5 | 7,099,173 | 2.6 |
| රඳවා ගත් ලාභය | 11,872,772 | 2.9 | (61,011) | 0.0 |
| බදු | 68,115,279 | 16.4 | 39,918,835 | 14.8 |
| වියදම් ණයහිමියන් | 152,522,736 | 36.8 | 119,328,207 | 44.3 |
| | 414,227,884 | 100 | 269,291,394 | 100 |



HLB Edirisinghe & Co
Chartered Accountants

සීමාසහිත ලංකා සතොස කොටස් හිමියන් වෙත නිකුත් කරන ස්වාධීන විගණන වාර්තාව

**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව**

අප සමාගම සීමාසහිත ලංකා සතොස වෙනුවෙන් පහත දැක්වෙන මුදල් ප්‍රකාශ විගණනයට ලක් කර ඇත. එනම් 2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසරේ ශේෂ පත්‍රය හා ආදායම් ප්‍රකාශනය අදාල වසරේ කොටස් හා මුදල් ප්‍රවාහය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සංක්ෂිප්ත වාර්තාවක් හා වෙනත් විග්‍රහාත්මක සටහන් ද ඊට ඇතුලත් වේ.

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරීත්වයේ වගකීම**

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට කළමනාකාරීත්වය වගකීමෙන් බැඳී සිටී. ඒ අනුව මෙම මුදල් ප්‍රකාශන සැළසුම් කිරීම, වංචා හෝ වැරදි හේතුකොට මූර්ත අවප්‍රකාශ වලින් තොරව සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම එම වගකීමට අයත් වේ. එමෙන්ම එම මූල්‍ය ප්‍රකාශන සුදුසු ගිණුම්කරන ප්‍රතිපත්ති තෝරා ගනිමින් ඒවා භාවිතයට ගෙන අවස්ථානුකූලව සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමද එම වගකීමට අයත් වේ.

**ගිණුම්කරණ විෂය පථය හා නිගමන පදනම**

අපේ වගකීම නම් මෙම මූල්‍ය ප්‍රකාශන කෙරෙහි අපේ විගණනය අනුව නිගමනයන් ප්‍රකාශ කිරීමයි. අපේ විගණන කටයුතු සිදු කෙරෙන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලවයි. අපේ විගණනය සැළසුම් කොට ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය ප්‍රකාශන ද්‍රව්‍යමය අවප්‍රකාශන වලින් තොරව ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා මෙම ප්‍රමිතීන් අවශ්‍ය වී ඇත.

විගණනයකදී අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පරීක්ෂණ පදනම මත විමර්ශනය කිරීම, සංඛ්‍යාලේඛන සනාථ කරන සාක්ෂි හා අනාවරණ කිරීම් ආදිය ඇතුළත් වේ. විගණනයකදී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා කළමනාකාරීත්වය ඉදිරිපත් කර ඇති ගිණුම් පිළිබඳව තක්සේරු කිරීම හා සමස්ථ මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරඇති ආකාරය පිළිබඳව ද සලකා බැළේ. අපේ උපරිම දැනුමේ හැටියට මෙම විගණන කාර්යය සඳහා ප්‍රමාණවත් තරම් තොරතුරු හා විග්‍රහ කිරීම් ලබාගෙන ඇත. එබැවින් මෙම විගණනය තුලින් අපේ නිගමනය පිළිබඳව සාධාරණ පදනමක් ඉදිරිපත් කරනු ඇති බව අපගේ විශ්වාසයයි.

**නිගමනය**

මූල්‍ය ප්‍රකාශන අංක 13 සටහනේ සඳහන් කර ඇති පරිදි පාරිතෝෂික ප්‍රතිපාදන ලබාදී තිබුනත් එම බැරකම් කාලානුරූපීව තක්සේරු කර නැත. අපේ නිගමනයට අනුව එම භාවිතාව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවේ. අපේ නිගමනයට අනුව කලින් ඡේදයේ විමසුමට ලක්වූ මූල්‍ය ප්‍රකාශනයේ කරුණු හැර අදාල විමර්ශන පරිදි 2008 දෙසැම්බර් 31 දිනට සමාගම ගිණුම් වාර්තා නිසි පරිදි පවත්වාගෙනගොස් ඇත. එමෙන්ම මූල්‍ය ප්‍රකාශන තුලින් 2008 දෙසැම්බර් 31 දිනට සමාගමේ කටයුතු පිළිබඳව සත්‍ය හා සාධාරණ විවරණයක් ඉදිරිපත් කර ඇත. එහි ලාභය වසරේ මුදල් ප්‍රවාහ ආදිය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඉදිරිපත් කර තිබේ.

**සෙසු නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 151 (2) කොටසේ අවශ්‍යතා වලට අනුකූල නොවේ.

එච්. එල්. බී එදිරිසිංහ සහ සමාගම
වරලත් ගණකාධිකාරීවරු

2010 සැප්තැම්බර් 15

# ලංකා සතොස
## සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

**සීමාසහිත ලංකා සතොස**
2008 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා
**ආදායම් ප්‍රකාශනය**

| | සටහන් | 2008<br>රු. ශත | 2007<br>රු. |
|---|---|---|---|
| ආදායම | **03** | 3,649,439,020.28 | 2,212,832,759 |
| විකුණුම් වියදම | | (3,251,129,572.82) | (1,949,316,730) |
| දළ ලාභය | | 398,309,447.46 | 263,516,029 |
| වෙනත් ආදායම් | **04** | 15,918,436.83 | 5,775,365 |
| බෙදාහැරීම් වියදම් | | (249,462,743.26) | (173,609,913) |
| පරිපාලන වියදම් | | (139,617,920.83) | (85,140,628) |
| මූල්‍ය වියදම් | **05** | (6,911,593.76) | (4,471,792) |
| | | (395,992,257.85) | (263,222,332) |
| මෙහෙයුම් වලින් ලාභය / (පාඩුව) | **06** | 18,235,626.44 | 6,069,062 |
| ආදයම් බදුවලට පෙර ලාභය / (පාඩුව) | | 18,235,626.44 | 6,069,062 |
| ආදායම් බදු වියදම් | **07** | (6,362,854.36) | (6,130,073) |
| ආදයම් බදුවලට පසු ලාභය / (පාඩුව) | | 11,872,772.08 | (61,011) |
| කොටසක් සඳහා ඉපැයීම්/(පාඩුව) | **08** | 1,696,110.30 | (8,716) |

වරහන් තුල ඇති අගයන් අඩුකිරීම් දක්වයි

ගිණුම් සඳහා වන සටහන් හා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අවියෝජනීය කොටසකි.

ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

# ලංකා සතොස
## සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

**සීමාසහිත ලංකා සතොස**
2008 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

| | | 2008 | 2007 |
|---|---|---|---|
| **යෙදවූ වත්කම් ජංගම නොවන වත්කම්** | සටහන් | රු. ශත | රු. |
| සතොස වෙතින් ලබාගත් දේපල යන්ත්‍රාගාර | 09 | 47,208,319.54 | 9,387,803 |
| හා උපකරණ | | 16,176,547.61 | 20,892,892 |
| ප්‍රමාද බදු වත්කම් | 10 | 3,246,517.83 | 2,068,235 |
| | | 66,631,384.98 | 32,348,930 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ ලැයිස්තු | | 485,711,647.89 | 286,223,632 |
| බැංකු ආරක්ෂණ | | 32,550,000.00 | 29,050,000 |
| කෙටිකාලීන ආයෝජන | | 0.00 | 27,000,000 |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | 11 | 38,481,931.75 | 15,673,262 |
| ආපසු ගෙවූ ආදායම් බදු | | 4,705,653.47 | 1,497,100 |
| රඳවා ගැනීමේ බද්ද | | 2,806.55 | 2,807 |
| පාලන ගිණුම | | 49,324,245.74 | 28,875,545 |
| ආශ්‍රිත සමාගම් වලින් ලැබිය යුතු දේ - සතොස | | 6,766,010.15 | 6,609,860 |
| මුදල් හා මුදල් සමාන දේ | | 3,575,810.03 | 1,816,157 |
| | | 621,118,105.58 | 396,748,363 |
| මුළු වත්කම් | | 687,749,490.56 | 429,097,293 |
| **වගකීම්** | | | |
| **කොටස් හා බැරකම්** | | | |
| **ප්‍රාග්ධනය සහ තැන්පතු** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 12 | 70.00 | 70 |
| රජයේ ගිණුම | | 334,599,930.00 | 209,600,000 |
| රඳවා ගත් ඉපැයුම් | | (8,350,973.08) | (20,141,703) |
| කොටස් කරුවන්ගේ අරමුදල් | | 326,249,026.92 | 189,458,367 |
| ජංගම නොවන බැරකම් | | | |
| ස.තො. සංස්ථාවෙන් ලබාගත් වත්කම් | | 22,798,842.00 | 26,109,915 |
| විශ්‍රාම සහන බැඳීම් | 13 | 8,908,651.02 | 4,280,417 |
| | | 31,707,493.02 | 30,390,332 |
| ජංගම බැරකම් | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවීම් | 14 | 171,729,159.05 | 169,614,706 |
| ණය | | 6,989,500.00 | 0 |
| සමාජ සේවා බදු ගෙවීම් | | 191,275.00 | 79,830 |
| බැංකු අයිරා | | 150,883,036.57 | 39,554,059 |
| මුළු වගකීම් | | 329,792,970.62 | 209,248,594 |
| | | 687,749,490.56 | 429,097,293 |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කොට ඇත්තේ 2007 අංක 7 දරණ සමාගම් ආඥාපණතේ අවශ්‍යතාවලට අනුකූලවය.

.................................
මූල්‍ය නිළධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටියි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලදී

.................... ....................
අධ්‍යක්ෂ අධ්‍යක්ෂ

ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අවියෝජනීය කොටසකි.

2010 සැප්තැම්බර් 15 කොළඹ



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

# ලංකා සතොස

සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

**සීමාසහිත ලංකා සතොස**
**2008 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**
**කොටස් වෙනස්කම් ප්‍රකාශය**

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රජයේ අරමුදල ගිණුම | රඳවාගත් ඉපැයීම් | මුලු ගණන |
|---|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 2007 ජනවාරි 01 දිනය ශේෂය | 70.00 | 145,000,000.00 | (17,548,698.72) | 127,451,371.28 |
| වසර සඳහා මුළු ලාභය /(පාඩුව) | 0.00 | 0.00 | (61,011.48) | (61,011.48) |
| අරමුදල් ලැබීම් | 0.00 | 64,600,000.00 | 0.00 | 64,600,000.00 |
| පෙර වසරේ ගැලපුම් | 0.00 | 0.00 | (2,531,992.36) | (2,531,992.36) |
| 2007 දෙසැම්බර් 31 දිනට ශේෂය | 70.00 | 209,600,000.00 | (20,141,702.56) | 189,458,367.44 |
| වසර සඳහා මුළු ලාභය /(පාඩුව) | 0.00 | 0.00 | 11,872,772.08 | 11,872,772.08 |
| අරමුදල් ලැබීම් | 0.00 | 124,999,930.00 | 0.00 | 124,999,930.00 |
| පෙර වසරේ ගැලපුම් | 0.00 | 0.00 | (82,042.60) | (82,042.60) |
| 2008 දෙසැම්බර් 31 දිනට ශේෂය | 70.00 | 334,599,930.00 | (8,350,973.08) | 326,249,026.92 |

වරහන් තුල ඇති අගයන් අඩුකිරීම් දක්වයි

ගිණුම් සඳහා වන සටහන් හා ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශන වල අවියෝජනීය කොටසකි.

2010 සැප්තැම්බර් 15
කොළඹ

## ලංකා සතොස
සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

**සීමාසහිත ලංකා සතොස**
**2008 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | 2008 | 2007 |
|---|---|---|
| **මෙහෙයුම් ප්‍රවාහ වලින් එන මූල්‍ය ප්‍රවාහ** | රු. ශත | රු. |
| බදුගෙවීමට පෙර ලාභය/(පාඩුව) | 18,235,626.44 | 6,069,062 |
| ගැලපුම් | | |
| ක්ෂයවීම | 10,425,994.96 | 7,099,173 |
| මුලු පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන | 4,628,234.35 | 2,682,500 |
| පෙර වසරේ ගැලපුම් | (82,042.60) | (2,531,992) |
| අධි ක්ෂයවීම් - සතොස වත්කම් | (3,154,497.17) | 0 |
| **ක්‍රියාකාරී ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය** | 30,053,315.98 | 13,318,743 |
| භාණ්ඩ ලැයිසතු වල (වැඩිවීම) / අඩුවීම | (199,488,015.72) | (167,926,449) |
| වෙළඳ සහ වෙනත් ලැබීම්වල (වැඩිවීම) / අඩුවීම් | (43,257,370.63) | (21,399,449) |
| සමාගම් ආශ්‍රිත (වැඩිවීම) / අඩුවීම් | (156,150.00) | (1,562,248) |
| වෙළඳ සහ වෙනත් ගෙවීම් වල (වැඩිවීම) / අඩුවීම් | 9,103,953.49 | 115,685,253 |
| **මෙහෙයුම් වලින් ඉපයූ මුදල්** | (203,744,266.88) | (61,884,150) |
| ආර්ථික සේවා ගාස්තු (ESC) ගෙවීම් | (10,638,245.00) | (6,655,704) |
| **මෙහෙයුම් කටයුතු වලින් එන මුලු මුදල් ප්‍රවාහ** | (214,382,511.88) | (68,539,855) |
| **ආයෝජන කටයුතු වලින් එන මුදල් ප්‍රවාහ** | | |
| දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ මිළදී ගැනීම | (43,686,743.08) | (5,577,069) |
| ස්ථාවර තැන්පතු / ආපසු ගැනීම් / ආයෝජන | 27,000,000.00 | (5,500,000) |
| සතොස වත්කම් මිළදී ගැනීම / පැවරීම | 0.00 | 0 |
| **ආයෝජන කටයුතු වලින් එන මුලු මුදල් ප්‍රවාහ** | (16,686,743.08) | (11,077,069) |
| **මූල්‍ය කටයුතු වලින් එන මුදල් ප්‍රවාහ** | | |
| භාණ්ඩාගාරයෙන් ලැබුණු අරමුදල් | 124,999,930.00 | 64,600,000 |
| බැංකු ආරක්ෂණ | (3,500,000.00) | (22,500,000) |
| **මූල්‍ය කටයුතු වලින් එන මුළු මුදල් ප්‍රවාහ** | 121,499,930.00 | 42,100,000 |
| **මුදල් හා ඒ හා සමාන මුලු වැඩිවීම** | (109,569,324.96) | (37,516,923) |
| **වසර ආරම්භයේ මුදල් හා ඒ හා සමාන ලැබීම්** | (37,737,901.58) | (220,978) |
| **වසර අවසානයේ මුදල් හා ඒ හා සමාන ලැබීම් (සටහන 1)** | (147,307,226.54) | (37,737,902) |
| **සටහන් - මුදල් හා ඒ සමාන දේ** | | |
| අත්මුදල් අත්තිකාරම් | 155,630.81 | 592,037 |
| ඉපිලෙන මුදල් | 648,494.80 | 458,494 |
| ඉතුරුම් තැන්පතු | 0.00 | 765,625 |
| බැංකු අයිරා | (150,883,036.57) | (39,554,059) |
| බැංකු ගිණුම | 2,771,684.42 | 0 |
| | (147,307,226.54) | (37,737,902) |

වරහන් තුළ ඇති අගයන් අඩුකිරීම් හුවාදක්වයි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අවියෝජනීය කොටසකි.

2010 සැප්තැම්බර් 15
කොළඹ



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

# ලංකා සතොස

## සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

**සීමාසහිත ලංකා සතොස**
**2008 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා වන**
**මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය ප්‍රතිපත්ති**

1. සංස්ථාපිත තොරතුරු

**1.1 පොදු**
සීමාසහිත ලංකා සතොස සීමිත බැරකම් සහිත ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමකි.
එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 01 යෝක් වීදිය අංක 108 දරණ ස්ථානයේ පිහිටා තිබේ. සමාගමේ ප්‍රධාන කාර්යය නම් පාරිභෝගික නිශ්පාදන සිල්ලර හා තොග වෙළඳාමයි.

**1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය**
වසර තුළ සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ පාරිභෝගික භාණ්ඩ තොග හා සිල්ලර වෙළඳාමයි.

2. **වැදගත් ගිණුම් ප්‍රතිපත්ති සාරාංශය**

**2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**2.1.1 සකස්කිරීමේ පදනම**
ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කොට ඇත්තේ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය දක්වා ඇති ප්‍රමිතීන්ට අනුකූලයව පවත්නා වැය පදනම යටතේය.

**2.1.2 අනකුලතා ප්‍රකාශනය**
2008 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා සමාගමේ ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශනය, කොටස් වල වෙනස්කම්, මුදල් ප්‍රවාහ සමග ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව සකස් කොට ඇත.

**2.1.3 ප්‍රවර්ථන ව්‍යාපාර**
සමාගමේ අධ්‍යක්ෂවරු සමාගම ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස අඛන්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳ තක්සේරුවක නිරතව සිටින අතර සමාගමේ වෙළඳාම් නතර කිරීමට හෝ සමාගම ඈවර කිරීමට හෝ අපේක්ෂා නොකරති.

**2.1.4 සංසන්දනාත්මක තොරතුරු**
සමාගම විසින් නිරතුරුවම මෙම ගිණුම් ප්‍රතිපත්ති අනුගමනය කර ඇති අතර පසුගිය කාලය පුරා එය අඛන්ඩව පවත්වාගෙන ගොස් ඇත. වත්මන් කාලයේ ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය අවස්ථා වල ඉකුත් සමයේ සංඛ්‍යා හා වාක්‍යාංශ යලි සකස්කොට යොදා ඇත.

**2.1.5 විදේශ මුදල් පරිවර්තනය**
සියළු විදේශ මුදල් ගණුදෙනු මෙහි වාර්තාකරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලට හරවා ඇති අතර ඒ සඳහා අදාල ගනුදෙනු සිදුවන අවස්ථාවේ පැවති විනිමය අනුපාතයන් සැලකිල්ලට ගෙන ඇත.

**සීමාසහිත ලංකා සතොස**
**මුදල් ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**2008 අවසන් වූ වසර සඳහා**

**2.2. වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම්**

**2.2.1. දේපල යන්ත්‍රාගාර උපකරණ**
**(අ) වැය**
දේපල යන්ත්‍රාගාර හා උපකරණ සඳහන් කර ඇත්තේ වැය රහිත සමුච්චිත ක්ෂයවීම් හා අගය අඩුවීම් සැළකිල්ලට ගනිමිනි.

**(ආ) ක්ෂයවීම්**
ක්ෂයවීම් ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ ඇස්තමේන්තු ගත භාවිතාකළ හැකි කාලසීමාව හා පහත දැක්වෙන වාර්ෂික ක්ෂයවීම් ප්‍රතිශතයන් සැලකිල්ලට ගෙන සරල රේඛීය ක්ෂයවීම් පදනම යටතේය.
භාවිතාකළ ප්‍රධාන වාර්ෂික ක්ෂයවීම් අනුපාතයන් පහත දැක්වේ.

| **(ප්‍රතිශතය) සියයට** | |
|---|---|
| කාර්යාල උපකරණ | 20% |
| පරිගනක | 25% |
| සන්නිවේදන උපකරණ | 20% |
| ගෘහභාණ්ඩ හා මෙවලම් | 20% |
| මෝටර්රථවාහන | 20% |

දේපල ක්ෂයවීම් ආරම්භ වන්නේ එම දේපල ප්‍රයෝජනයට ගත් දින සිටය.

සෑම මුදල් වර්ෂයකදීම දේපල වල ඉතිරි අගයන් ප්‍රයෝජනයට ගතහැකි කාලසීමාව හා ක්ෂයවීම් ක්‍රමවේද සුදුසු පරිදි සමාලෝචනය කොට ගලප ගන්නා ලදි

**(ඇ) පුනරුත්ථාපන වැය**
මූලික වශයෙන් තක්සේරු කරන ලද කාර්යය සාධන ප්‍රමිතීන් තුලින් අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ යලි ස්ථාපනය කිරීමට හෝ පවත්වාගෙන යාම සඳහා දේපල, යන්ත්‍රාගාර හා උපකරණ අලුත්වැඩියාව හෝ නඩත්තුව වෙනුවෙන් දරණ ලද වියදම ඒ ඒ අවස්ථාවේ දරණ ලද වියදම් ලෙස හඳුනාගනු ලැබේ.

**(ඈ) අව-පිළිගැනීම**
කිසියම් දේපලක් යන්ත්‍රාගාරයක් හෝ උපකරණයක් අවපිලිගැනීමට ලක් කරනු ලබන්නේ එය ඉවත් කරනු ලබන විට හෝ එය භාවිතයෙන් හෝ ඉවත් කිරීමෙන් අනාගත ආර්ථික වාසියක් නොලැබෙන අවස්ථාවකදීය. කිසියම් දේපලක් අවපිලිගැනීමේදී මතුවන ලාභය හෝ පාඩුව මුළු බැහැර කිරීම් ක්‍රියාවලිය හා පවතින ප්‍රමාණය අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ.

**2.2.2 භාණ්ඩ ලැයිස්තුව**
සෙමෙන් අලෙවි වන අභාවිත භාණ්ඩ කෙරෙහි ඉඩහරිමින් අවම වැය හා සාක්ෂාත් කරගත හැකි ශුද්ධ අගය මත භාණ්ඩ ලේඛන සඳහන් කර ඇත. සාමාන්‍ය වෙළඳාමේදී ලැයිස්තුගත භාණ්ඩ අලෙවි කෙරෙන්නේ පූර්ණ තක්සේරු වැය හා අලෙවිය පවත්වාගෙන යාමට අවශ්‍ය ඇස්තමේන්තු වැයට අඩුවෙන් ඒ ඒ අවස්ථාවේ සාක්ෂාත් කර ගත හැකි ශුද්ධ අගය මතය.

2010 ඔක්තෝබර් 27

# ලංකා සතොස
## සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

**සීමාසහිත ලංකා සතොස**
**මුදල් ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**2008 අවසන් වූ වසර සඳහා**

**2.2.3 වෙළඳ හා වෙනත් ලැබීම්**
වෙළඳ හා වෙනත් ලැබීම් ප්‍රකාශිතව ඇත්තේ අයෝග්‍ය හා සැකසහිත ලැබීම් සඳහා සාක්ෂාත් කර ගත හැකි ප්‍රතිපාදන තක්සේරු කරගැනීමෙන් පසුවය.

අදාල පාර්ශවකරුවන්ගෙන් ලැබිය යුතු වෙනත් ලැබීම් හඳුන්වනු ලබන්නේ බොල් හා සැකසහිත ලැබීම් සඳහා වැය ප්‍රතිපාදන අඩුකිරීමට යටත්වය.

**2.2.4 මුදල් හා මුදල් සමාන දේ**
මුදල් හා මුදල් සමාන දේ ලෙස අර්ථදැක්වෙන්නේ අතේ ඇති මුදල්, ඉල්ලුම් තැන්පත් හා කෙටිකාලීන ඇඩි ද්‍රවශීල ආයෝජන, පහසුවෙන් මාරුකල හැකි බවට හඳුනාගත් මුදල් හා අගය වෙනස්වීමේ අවදානමට ඉතා සුලුවෙන් ලක්වූ මුදල්ය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය උදෙසා මුදල් හා මුදල් සමාන දේ ලෙස අතේ ඇති මුදල් හා බැංකු තැන්පතු, හිඟව තිබෙන බැංකු අයිරා, කෙටිකාලීන කල්පිරීම් සහිත අයෝජන ද (උදා. තුන් මාසයක් හෝ ඊට අඩු කාලයකින් යලි අත්පත් කරගත හැකි) සලකනු ලැබේ.

**2.2.5 ආයෝජන**
වත්මන් ආයෝජන වටිනාකම මත ප්‍රකාශිතව ඇත.

**2.3 බැරකම් සහ ප්‍රතිපාදන**

**2.3.1 බැරකම්**
ශේෂ පත්‍රයේ වත්මන් බැරකම් යටතේ ප්‍රකාශිත බැරකම් යනු ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුලත ලැබීමට අපේක්ෂිත ඒවාය. දිගු කාලීන බැරකම් ලෙස ප්‍රකාශිත අයිතම නම් ශේෂ පත්‍රයේ දිනට වසරකට පසු කාල සීමාවේදී ලැබීමට අපේක්ෂිත ඒවාය.

වෙළඳ සහ වෙනත් ගෙවීම්
වෙළඳ ණය හිමියන් හා වෙනත් ගෙවීම් ඒවායේ පොත් අගය සඳහන් කෙරේ.

**2.3.2 ප්‍රතිපාදන**
අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමාගමට වත්මන් බැඳීමක් (නෛතික හෝ අර්ථදායක) ඇතිවිට ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. එහිදී සමාගමේ බැඳීම් නිරාකරණය සඳහා සමාගමට ආර්ථික ප්‍රතිලාභ උදා කෙරෙන සම්පත් ගලායාම අවශ්‍ය කෙරේ. එමෙන්ම එම බැඳීමේ ප්‍රමාණයද විශ්වසනීය තක්සේරුවක් එම ප්‍රතිපාදන මගින් සිදුකල හැකිය.

**සීමාසහිත ලංකා සතොස**
**මුදල් ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**2008 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**

**2.3.2.1. විශ්‍රාම සහන බැඳීම්**
**(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික**
1983 අංක 12 පාරිතෝෂික පනතේ (ස.ල.ග.සේ) 16 ට සමානුරූපීව වට්ටෝරු ක්‍රමය භාවිතයෙන් විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා ප්‍රතිපාදන සළසා නැත. ගිණුම්කරන ප්‍රමිත 57 පරිච්ඡේදයට අනුව භාණ්ඩ වෙළඳාමේ හා සැපයීමේ සේවාවල නිරත මහජන සංස්ථා විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා සුදුසු ක්‍රමවේදයක් හෝ පාරිතෝෂික සූත්‍ර ක්‍රමයක් භාවිතා කල යුතුවේ. කෙසේ වෙතත් සමාගම එය සිදුකර ඇත්තේ සරල ක්‍රමයක් භාවිතා කරමිනි.

**(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්**
සේවක අර්ථසාධක අරමුදල (EPF) හා සේවක භාරකාර අරමුදල (ETF)
අදාල අනපණත් හා රෙගුලාසි වලට අනුකූලව සේවකයෝ සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල දායකත්වයට සුදුසුකම් ලබා සිටිති. සමාගම සේවකයින්ගේ දළ වැටුප මෙන් සියයට 12 කින් සේවක අර්ථසාධක අරමුදල සඳහා ද සියයට 3 කින් සේවක භාරකාර අරමුදල සඳහාද දායක වෙයි.

**2.3.2.2 බදුකරණය**

**(අ) වත්මන් බදු**
ආදායම් බදු ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කොට ඇති පරිදි ආදායම් හා වියදම් මූලිකාංග මත පදනම්ව සකස් කොට ඇති අතර 2006 අංක 10 දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන වලට අනුකූලව ගණනය කෙරේ.

**2.4 ආදායම් ප්‍රකාශනය**
**2.4.1 ආදායම් පිළිගැනීම**

**(අ) භාණ්ඩ අලෙවිය**
ආදායම් හඳුනාගනු ලබන්නේ සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ සම්භාව්‍යතාව අනුවය. ආදායම් හා දරන ආශ්‍රිත වියදම් විශ්වාසනීය ලෙස ගණනය කළ හැකිය. ආදායම මනිනු ලබන්නේ ලැබිය හැකි මුළු වෙළඳ වට්ටම් හා අලෙවි බදු වල සාධාරණ අගය සැලකිල්ලට ගැනීමෙනි.

**(ආ) පොලිය**
පොලී ආදායම හඳුනාගනු ලබන්නේ එක්රැස්කරගැනීම සැකසහිත නොවන විට එකතු වූ පොලිය මතය.

**(ඇ) වෙනත්**
වෙනත් ආදායම් හඳුනාගනු ලබන්නේ එකතුවන පදනම මතය.

දේපල, යන්ත්‍රාගාර උපකරණ හා ආයෝජන ඇතුළු වෙනත් ජංගම නොවන වත්කම් බැහැර කිරීම මත ආදායම් ස්වභාවයේ සිදුවන ශුද්ධ ලාභය සහ පාඩු පිළිබඳව ආදායම් ප්‍රකාශනයේ හේතු දක්වා ඇත. එම බැහැරකිරීම් ක්‍රියාවලියේදී අදාල දේපල යන්ත්‍රාගාර හා උපකරණ ආදී වත්කම් වල ධාරණ අගය යලි තක්සේරු කිරීමට ලක්කොට සෘජුවම එම වත්කම් සමුච්චිත පාඩුවක් ලෙස සලකනු ලැබේ.

**2.4.2. වියදම් හඳුනාගැනීම**
(අ) ආදායම් ප්‍රකාශනයේ වියදම් හඳුනාගනු ලබන්නේ දරණ ලද වැය හා විශේෂිත ආදායම් අයිතම, ලද ඉපැයීම් අතර සෘජු සම්බන්ධතා පදනම යටතේය. ව්‍යාපාර පවත්වාගෙන යාමෙදී හා දේපල, යන්ත්‍රාගාර හා උපකරණ කාර්යක්ෂම ලෙස නඩත්තු කිරීමේදී දරණ ලද සියලු වියදම් වසරේ ලාභය සඳහා හේතුවූ ආදායමක් බවට හරවා තිබේ.

(ආ) ආදායම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කටයුත්ත වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය දරන මතය නම් එහි වියදම් මෙහෙයුම් ක්‍රමවේදය සමාගමේ කාර්ය සාදන මූලික ප්‍රතිපත්ති වලට සාධාරණ වව බවයි. ඒ අනුකූලව ඉදිරිපත් කිරීම් ක්‍රමවේදය භාවිත කල බව අධ්‍යක්ෂ මණ්ඩලයේ පිලිගැනීමයි.

**2.5 ශේෂ පත්‍රයෙන් බැහැර වූ හා ආදායම් ප්‍රකාශනයේ අයිතම**

**2.5.1 ශේෂ පත්‍රයෙන් පසුව සිදුවූ අවස්ථා**
ශේෂ පත්‍රය නිමකළ දිනට පසුව සිදුවූ සියලු භෞතික සිදුවීම් සැළකිල්ලට ගෙන ඇති අතර අවස්ථානුකූලව අවශ්‍ය ගැලපීම් හෝ අනාවරණ කිරීම් මුදල් ප්‍රකාශනයේ අදාල සටහන් වල ඇතුලත් කොට ඇත.

**2.5.2 අවිනිශ්චිත අවස්ථා සහ හඳුනා නොගත් ගිවිසුම්කර බැඳීම්.**
අවිනිශ්චිත අවස්ථා යනු අතීත සිදුවීම් අනුව මතුවිය හැකි වත්කම් හෝ බැඳීම් වන අතර ඒවා සමාගමේ පාලනයට නතු නොවන මෙන්ම සිදුවීම හො සිදු නොවීම මත පමනක් තහවුරු කරගත හැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් වේ.

# ලංකා සතොස
## සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

**සීමාසහිත ලංකා සතොස**
**මුදල් ගිණුම් සඳහා සටහන්**
2008 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

| | 2008 | 2007 |
|---|---|---|
| **සටහන -3. ආදායම** | රු. ශත | රු. |
| ආදායම | 3,711,191,445.17 | 2,246,621,521 |
| පිරිවැටුම් බද්ද | (61,752,424.89) | (33,788,762) |
| | 3,649,439,020.28 | 2,212,832,759 |
| **සටහන 4. වෙනත් ආදායම්** | | |
| ස්ථාවර තැන්පත් සඳහා පොලිය | 1,962,863.01 | 2,949,750 |
| ඉතුරුම් ගිණුම් පොලිය | 3,281.66 | - |
| ප්‍රවාහන ආදායම | 1,261,819.45 | 984,107 |
| විවිධ ආදායම් | 2,215,085.48 | 905,932 |
| ගොන්ඩෝලා ආදායම | 348,000.00 | 66,400 |
| ඇමතුම් තැන්පත් පොලිය | 1,335,484.32 | 544,694 |
| භාණ්ඩ සංක්‍රමණයේදී වන හිඟ පියවීම | 0.00 | 20,856 |
| අතිරික්ත තොග | 0.00 | 303,326 |
| වෙළඳ ප්‍රචාරණ ප්‍රතිපූර්ණය | 542,179.14 | - |
| රක්‍ෂණ වන්දි ලැබීම් | 599,991.41 | - |
| භාණ්ඩ ලැයිස්තුගත කිරීමේ වියදම් | 4,000.00 | - |
| දුරකථන ගාස්තු පියවා ගැනීම | 59,842.99 | - |
| ජංගම දුරකථන සිම් කාඩ්පත් | 2,300.00 | - |
| දඩ | 0.00 | 300 |
| පොදු ප්‍රතිපාදන | 4,429,092.20 | - |
| අධි ක්‍ෂයවීම් - සතොස වත්කම් | 3,154,497.17 | - |
| | 15,918,436.83 | 5,775,365.10 |
| **සටහන - 05 මූල්‍ය වියදම්** | | |
| හර බද්ද | 2,945,439.92 | 2,067,968 |
| බැංකු ගාස්තු හා කොමිස් | 3,807,153.84 | 2,242,574 |
| චෙක් පොත් ගාස්තු | 159,000.00 | 161,250 |
| | 6,911,593.76 | 4,471,792 |

**සටහන -6. මෙහෙයුම් වලින් ලද ලාභය ප්‍රකාශිතව ඇත්තේ පහත සඳහන් වියදම් ඇතුලු සියලු වියදම් අයකර ගැනීමෙන් පසුවයි.**

| | | |
|---|---|---|
| වැටුප් | 135,978,136 | 77,156,587 |
| අතිකාල | 16,071,910 | 10,837,886 |
| සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය | 13,465,375 | 9,146,974 |
| සේවක භාරකාර අරමුදල් දායකත්වය | 1,346,538 | 914,697 |
| විගණනකරුවන්ගේ වැටුප් | 242,000.00 | 124,200 |
| ක්ෂය වීම් | 10,425,995 | 7,099,173 |
| තොග හිඟ පාඩු | 5,981,888 | 16,992,982 |
| තොග පාඩු - ඉවත දමන ලද | 8,715,820 | 5,727,926 |
| නිශ්චිත ප්‍රතිලාභ වැය / පාරිතෝෂික | 4,628,234.35 | 2,682,500 |
| ප්‍රධාන විධායක නිලධාරී හට සහ අධ්‍යක්ෂවරුන් සඳහා යැපුම් දීමනා | 51,000.00 | 46,500 |
| පොදු ප්‍රතිපාදන - ප්‍රසාද දීමනා | 4,429,092.20 | 4,950,000 |
| ග්‍රොසරි බෑග් | 23,759,619.06 | 25,609,260 |
| | 225,095,607.48 | 161,288,685 |

**7 - ආදායම් බදු වියදම්**

| | | |
|---|---|---|
| ඌණ ප්‍රතිපාදන ආදායම් බදු | 0.00 | 87,135 |
| ESC කපා හැරියා | 0.00 | 48,350 |
| වත්මන් ආදායම් බදු ප්‍රතිපාදන | 7,541,137.00 | 8,062,824 |
| ප්‍රමාද බදු ප්‍රතිපාදන | (1,178,282.64) | (2,068,235) |
| | 6,362,854.36 | 6,130,073 |

**8 කොටසක් සඳහා ඉපැයීම් / (පාඩු)**

සාමාන්‍ය කොටසක් සඳහා මූලික ඉපැයීම් / පාඩුව ගණනය කරනු ලබන්නේ වසර සඳහා සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපනය වන ශුද්ධ ලාභය /(පාඩුව) ශේෂ පත්‍රයේ දිනට නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් ප්‍රමාණයෙන් බෙදනු ලැබීමේ පදනම මතය.

**ලවය ලෙස භාවිත ප්‍රමාණය**

| | | |
|---|---|---|
| සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපිත ලාභය /(පාඩුව) | 11,872,772.08 | (61,011) |

**හරය ලෙස භාවිත සාමාන්‍ය කොටස් සංඛ්‍යාව**

| | | |
|---|---|---|
| නිකුත් කල සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | 7 | 7 |
| කොටසක මූලික ඉපැයුම් (රු) | 1,696,110.30 | (8,716) |

# ලංකා සතොස
## සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

සීමාසහිත ලංකා සතොස
මුදල් ප්‍රකාශන සඳහා සටහන්
2008 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

| 09. දේපල යන්ත්‍රාගාර හා උපකරණ | 2008.01.01 ශේෂය | එකතුකිරීම් | 2008.12.31ට ශේෂය |
|---|---|---|---|
| **වැය/තක්සේරුව** | රු.ශත | රු.ශත | රු.ශත |
| මෝටර් වාහන | 0.00 | 5,413,500.00 | 5,413,500.00 |
| පරිඝනක උපකරණ | 1,926,990.75 | 3,316,511.00 | 5,243,501.75 |
| කාර්යාල උපකරණ | 4,945,933.06 | 34,706,290.58 | 39,652,223.64 |
| ගෘහභාණ්ඩ හා මෙවලම් | 4,280,418.71 | 121,588.50 | 4,402,007.21 |
| සන්නිවේදන උපකරණ | 1,637,956.38 | 128,853.00 | 1,766,809.38 |
| | 12,791,298.90 | 43,686,743.08 | 56,478,041.98 |
| **ක්ෂයවීම්** | | | |
| මෝටර් වාහන | 0.00 | 541,350.00 | 541,350.00 |
| පරිඝනක උපකරණ | 816,026.31 | 698,319.15 | 1,514,345.46 |
| කාර්යාල උපකරණ | 488,833.92 | 3,426,583.05 | 3,915,416.97 |
| ගෘහභාණ්ඩ හා මෙවලම් | 1,531,428.28 | 858,590.88 | 2,390,019.16 |
| සන්නිවේදන උපකරණ | 567,207.55 | 341,383.29 | 908,590.84 |
| | 3,403,496.07 | 5,866,226.37 | 9,269,722.44 |
| **ලිඛිත අගයන්** | | | |
| මෝටර් වාහන | 0.00 | | 4,872,150.00 |
| පරිඝනක උපකරණ | 1,110,964.44 | | 3,729,156.29 |
| කාර්යාල උපකරණ | 4,457,099.14 | | 35,736,806.67 |
| ගෘහභාණ්ඩ හා මෙවලම් | 2,748,990.43 | | 2,011,988.05 |
| සන්නිවේදන උපකරණ | 1,070,748.83 | | 858,218.54 |
| | 9,387,802.83 | | 47,208,319.54 |

**සීමාසහිත ලංකා සතොස**
**මුදල් ගිණුම් සඳහා සටහන්**
2008 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

| | 31.12.2008 | 31.12.2007 |
|---|---|---|
| **10. ප්‍රමාද බදුකරණ ප්‍රතිපාදන** | රු.ශත | රු.ශත |
| වසර මුල ශේෂය | 2,068,235.19 | 0 |
| වත්කම් ප්‍රකාශනයයෙන් / (ට) මාරු කලා | 1,178,282.64 | 2,068,235 |
| වසර අවසානයේදී ශේෂය | 3,246,517.83 | 2,068,235 |
| **11. වෙළඳ සහ වෙනත් ලැබීම්** | | |
| කුලී අත්තිකාරම් | 18,495,813.50 | 3,654,622 |
| මත්පැන් බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු පෙර ගෙවීම් | 1,839,512.50 | 0 |
| සිගරට් අත්තිකාරම් | (2,965.00) | 67,879 |
| කුලී තැන්පතු | 75,000.00 | 75,000 |
| ස්ථාවර තැන්පත් පොලිය | 921,562.50 | 921,563 |
| යලි අත්පත් කරගත හැකි තොග හිග | 831,335.61 | 1,113,670 |
| පෙර ගෙවීම් | 85,172.50 | 2,027,310 |
| අගරු චෙක්පත් | 242,614.86 | 242,615 |
| ආපසු ගෙවනු ලබන තැන්පතු | 178,500.00 | 186,000 |
| යාපනය රජයේ නියෝජිත | 0.00 | 998,835 |
| පිරිවැටුම් බදු අධි ගෙවීම් | 3,989.00 | 3,989 |
| ඌණ ප්‍රේශණය | 15,026,767.45 | 6,291,843 |
| තොග පාඩු යලි අත්කර ගැනීම | 89,867.40 | 89,867 |
| වෙනත් ලැබීම් - කොටස් සඳහා | 0.00 | 70 |
| ආපදා ණය | 627,081.43 | 0 |
| ජංගම දුරකථන එකතු කිරීමේ ගාස්තු | (58,800.00) | 0 |
| නිව්වේල් ප්‍රචාරණය | 117,300.00 | 0 |
| වැටුප් ආපසු ලැබීම් | 9,180.00 | 0 |
| | 38,481,931.75 | 15,673,262 |
| **12. ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | |
| නිකුත් කල සාමාන්‍ය කොටස් | 70.00 | 70 |
| | 70.00 | 70 |
| **13. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්** | | |
| වසර මුලදී ශේෂය | 4,280,416.67 | 1,597,917 |
| වසර සඳහා ප්‍රතිපාදන | 4,628,234.35 | 2,682,500 |
| | 8,908,651.02 | 4,280,417 |
| **ගෙවීම්** | 0.00 | 0 |
| වසර අවසානයේ ශේෂය | 8,908,651.02 | 4,280,417 |

**සටහන - 2008 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ප්‍රතිලාභ වියදම් ශේෂය**

**කාලානුරූපීව තක්සේරු කර නොමැත**

## 14. වෙළඳ සහ වෙනත් ගෙවීම්

| | | |
|---|---|---|
| වෙළඳ ණය හිමියෝ | 106,328,544.20 | 114,084,336 |
| වියදම් ණය හිමියෝ | 65,400,614.85 | 55,530,370 |
| | 171,729,159.05 | 169,614,706 |

## 15. පොරොන්දු වූ වත්කම්

බැරකම් සඳහා ආරක්ෂණ ලෙස පහත දැක්වෙන වත්කම් පොරොන්දු වී තිබේ.

| වත්කම් ස්වභාවය | බැරකම් ස්වභාවය | **2008** | **2007** |
|---|---|---|---|
| ස්ථාවර තැන්පත් | බැංකු ආරක්ෂණ | 32,550,000.00 | 19,500,000 |

## 16. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

16.1 ශේෂ පත්‍ර දිනය වනවිට ශ්‍රී ලංකා සතොස සමාගම ශාඛා 98 ක් මෙහෙයවා තිබේ. එම දිනට පසුව ශාඛා 108 ක් විවෘත කර තිබේ. ඒ අනුව විගණන වාර්තා දිනය වනවිට ශාඛා 206 ක් මෙහෙයවමින් පවතී.

## 17. ආශ්‍රිත පාර්ශවකරුවන්ගේ ගනුදෙනු

සමාගමේ කිසිදු අධ්‍යක්ෂවරයෙක් දැනට සමාගමේ පවතින හෝ යෝජිත කොන්ත්‍රාත් සඳහා ඍජුව හෝ වක්‍රව සම්බන්ධකම් නොපවත්වයි

## ලංකා සතොස

සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

### සීමාසහිත ලංකා සතොස

2008 දෙසැම්බර් 31 ට දිවයින පුරා ශාඛා ජාලය

1 මීගමුව
2 රත්මලාන
3 පිළියන්දල
4 බත්තරමුල්ල
5 හෝමාගම
6 කිරිබත්ගොඩ
7 හොරණ
8 මීරිගම
9 වේගන්ගොඩ
10 හලාවත
11 මාරවිල
12 වෙන්නප්පුව
13 කටුනායක
14 රද්දොළුගම
15 කොහුවල
16 කොටහේන
17 මිනුවන්ගොඩ
18 මොරටුව
19 ගනේමුල්ල
20 සෙත්සිරිපාය
21 අලුත්ගම
22 බණ්ඩාරගම
23 රත්නපුර
24 පැල්මඩුල්ල
25 බලංගොඩ
26 අවිස්සාවේල්ල
27 ඇහැලියගොඩ
28 ඇඹිලිපිටිය
29 බුත්තල
30 හම්බන්තොට
31 කතරගම
32 තංගල්ල
33 බෙලිඅත්ත
34 අම්බලන්තොට
35 තිස්සමහාරාමය
36 අකුරැස්ස
37 මාලිම්බඩ
38 අනුරාධපුර
39 කැකිරාව
40 පින්නදූව
41 පුත්තලම
42 මාතලේ
43 නාරම්මල
44 පොල්ගහවෙල
45 මාලඹේ
46 පොලොන්නරුව
47 කලවාන
48 බදුල්ල
49 මැකලම් පාර
50 කුරුඳුවත්ත
51 ගල්කිස්ස
52 කොළඹ සරසවිය
53 කැළණිය
54 කලුතර
55 නිග්රිස් කොටුව
56 හිඟුරග්ගොඩ
57 කොටියාකුඹුර
58 දේවාලේගම
59 අම්පාර
60 කෑගල්ල
61 මතුගම
62 නාවලපිටිය
63 ආණමඩුව
64 පස්සර
65 බණ්ඩාරවෙල
66 යටියන්තොට
67 වැල්ලවාය
68 හික්කඩුව
69 මොණරාගල
70 කොටදෙනියාව
71 රක්වාන
72 මැදගම
73 කුලියාපිටිය
74 බොරලැස්ගමුව
75 සමන්තුරයි
76 ගම්පහ
77 අතුරුගිරිය
78 මාතර
79 රාගම
80 නිවිතිගල
81 ගම්පොල
82 හෝකන්දර
83 පානදුර
84 මහරගම
85 මහබාගේ
86 වොක්ෂෝල් වීදිය
87 පිලියන්දල
88 පානදුර
89 නෙලුව
90 හක්මන
91 මත්තේගොඩ
92 වාරියපොල
93 හංවැල්ල
94 ජුබිලිකණුව
95 පාදුක්ක
96 පූඩලුඔය
97 කිරිඇල්ල
98 අම්බලන්ගොඩ
99 විජේරාම
100 ජා ඇල



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

# Annual Report 2008



**LANKA SATHOSA LIMITED**
No. 108, 1st Floor, Negris Building,
York Street, Colombo 01.

General Phone No. : 2436301 - 2
Fax : 2437583